" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.
ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI SYSTEM CERTIFIED ISO 9001
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/FIN-AP/03/FI/13(B) | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2021.01/11 |
|---|---|---|---|---|---|

## මූල්‍ය චක්‍රලේඛ 06/2015(V)

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.).

## රජයේ ආයතන සහ නිලධාරීන් සඳහා සන්නිවේදන පහසුකම් සැපයීම හා බිල්පත් නිරවුල් කිරීම.

රජයේ ආයතන වල නිලධාරීන්ට සිය රාජකාරී ඉටු කිරීම පිණිස මාසික ඒකාබද්ධ වියදම් සීමාව ඇතුලත දුරකතන හා අන්තර්ජාල පහසුකම් සලසාදීම සඳහා නිකුත් කරන ලද 2015.04.07 දිනැති බස්නාහිර පළාත් මූල්‍ය චක්‍රලේඛ අංක 06/2015ට වැඩිමනත් වශයෙනි.

02. ඉහත චක්‍රලේඛයේ 02 වන වගන්තිය යටතේ ඇති වගුවේ කාණ්ඩ අංක iv හි සඳහන් තනතුරුවලට අමතරව, විධායක නිලධාරී සේවක ගණයට අයත් වන නිලධාරීන්ගේ ශ්‍රේණිගත උසස්වීම් අනුව තනතුරුනාමය වෙනස් නොවන අවස්ථාවලදී පහත පරිදි කටයුතු කල යුතු බව දැනුම් දී ඇත.

a) විධායක නිලධාරී සේවා ගණය යටතේ වැටුප් ලබන නිලධාරියකු එම වැටුප් ක්‍රමයේ සඳහන් II වන ශ්‍රේණියට හෝ I වන ශ්‍රේණියට උසස්ව SL-1 වැටුප් ක්‍රමයේ II වන හෝ I වන ශ්‍රේණියේ වැටුප් ලබමින් III වන ශ්‍රේණියේ තනතුරක සේවය කරන්නේ නම් එවැනි නිලධාරීන්ගේ දුරකතන වියදම් සීමාව ලෙස චක්‍රලේඛයේ iv කාණ්ඩය අදාල කර ගත යුතුය.

b) විධායක නිලධාරී සේවා ගණය යටතේ I වන ශ්‍රේණියට උසස්ව SL-1 වැටුප් ක්‍රමයේ I වන ශ්‍රේණියේ වැටුප් ලබමින් II වන ශ්‍රේණියේ තනතුරක සේවය කරන්නේ නම් එවැනි නිලධාරීන්ගේ දුරකතන වියදම් සීමාව ලෙස සැලකිය යුත්තේ එම II වන ශ්‍රේණියේ තනතුරට නියමිත චක්‍රලේඛයේ iv කාණ්ඩයට අයත් දීමනාව විය යුතුය.

c) තනතුර අයත් ශ්‍රේණිය ලෙස සැලකිය යුත්තේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් විධිමත් පරිදි තනතුර අනුමත කර ඇති ශ්‍රේණියයි.

03. මෙම විධිවිධාන මෙදින සිට ක්‍රියාත්මක වන අතර, 2015.04.07 දිනැති මූලා චක්‍රලේඛ අංක 06/2015 හි දැක්වෙන අනෙකුත් විධිවිධානයන් ඒ අයුරින්ම බලපැවැත්වෙන බව කාරුණිකව දන්වමි.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්, පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් .
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත: 01.විගණකාධිපති
02. ප්‍රධාන නීති නිලධාරී.
03.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
04.තොරතුරු තාක්ෂණ නිලධාරී